ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk


# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2012/09/28 |

## 2012 සැප්තැම්බර් මාසයේ දී උද්ධමනය තවදුරටත් පහළ වැටෙයි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/2007=100) මගින් මනිනු ලබන උද්ධමනය, ප්‍රධාන වශයෙන්ම ආහාර කාණ්ඩයේ මිල ගණන් අඩුවීම හේතුවෙන් ලක්ෂ්‍යමය පදනම මත පූර්ව මාසයේ පැවති සියයට 9.5 හි සිට 2012 සැප්තැම්බර් මාසයේ දී සියයට 9.1 දක්වා පහළ වැටිණි. කෙසේ වුවද, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2012 අගෝස්තු මාසයේ පැවති සියයට 6.3 හි සිට සැප්තැම්බර් මාසයේ දී සියයට 6.5 දක්වා ඉහළ නැගිණි.

මේ අතර, මූලික උද්ධමනය ලක්ෂ්‍යමය පදනම මත 2012 අගෝස්තු මස පැවති සියයට 5.9 හි සිට 2012 සැප්තැම්බර් මාසයේ දී සියයට 6.2 දක්වා ඉහළ නැගුණු අතර, වාර්ෂික සාමාන්‍ය පදනම මත මූලික උද්ධමනය එහි පහළ යාමේ නැඹුරුව අඛණ්ඩව පවත්වා ගනිමින් පූර්ව මාසයේ පැවති සියයට 5.4 හි සිට සැප්තැම්බර් මාසයේ දී සියයට 5.3 දක්වා ලඟා විය.




කො.පා.මි. දර්ශක අගය 2012 අගෝස්තු මාසයේ දී පැවති 165.7 හි සිට සැප්තැම්බර් මාසයේ දී 165.5 දක්වා නිරපේක්ෂ වශයෙන් අඩු වෙමින් පූර්ව මාසයට සාපේක්ෂව සියයට 0.1 කින් පහළ වැටිණි. ආහාර කාණ්ඩයේ මිල ගණන් පහළ වැටීම (සියයට 0.3 කින්) දර්ශකයේ මෙම මාසික පහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. කො.පා.මි. දර්ශකයේ ආහාර කාණ්ඩයේ පහළ යාම සඳහා බොහෝ එළවළු වර්ග, මත්ස්‍ය හා මුහුදු ආහාර, අර්තාපල්, ලොකු ළූණු සහ රතු ළූණු ආදියේ මිල ගණන් පහළ යාම හේතු විය. කෙසේ වුවද, බිත්තර, පලතුරු, ළදරු කිරිපිටි සහ සහල් ආදියේ මිල ගණන්වල ඉහළ යාමක් මෙම මාසය තුළ වාර්තා විය. ආහාර නොවන කාණ්ඩයේ රෙදිපිළි හා පාවහන් (සියයට 0.7 කින්); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු (සියයට 0.2 කින්); සෞඛ්‍යය (සියයට 0.3 කින්); සහ විවිධ භාණ්ඩ හා සේවා (සියයට 1.0 කින්) යන උප කාණ්ඩයන්හි මිල ගණන් සුළු වශයෙන් ඉහළ නැගිණි. මේ අතර, නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන; ප්‍රවාහන; සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික සහ අධ්‍යාපන යන උප කාණ්ඩයන්හි මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.